8522

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | 06 | විෂයය / பாடம் / Subject | විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I ,II | කාලය / காலம் / Time | පැය 02යි. |
|---|---|---|---|---|---|---|---|

නම:-.................................................. විභාග අංකය:-..................................................

සැලකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- II කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු ලියන්න.

## I කොටස

01. පරිසරයේ උෂ්ණත්වය වෙනස් වුවද, මිනිස් සිරුරේ උෂ්ණත්වය වෙනස් නොවේ. මිනිස් සිරුරේ සාමාන්‍ය උෂ්ණත්වය දක්වා ඇති නිවැරදි පිළිතුර කුමක් ද?

1. 36 $^0$C
2. 37 $^0$C
3. 25 $^0$C
4. 26 $^0$C

02. ජීවීන්ගේ අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාවලියක් පහත දක්වා ඇත. එම ක්‍රියාවලිය කුමක් ද?




1. වර්ධනය
2. චලනය
3. පෝෂණය
4. ප්‍රජනනය

03. පරිසරය නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර චාරිකාවක යෙදුනු සිසුන්ට පහත දැක්වෙන හොටවල් සහිත පක්ෂීන් දැකීමට අවස්ථාව ලැබුණි.




පක්ෂීන්ගේ හොටවල්වල ඉහත දැක්වෙන විවිධත්වය ලැබීමට වඩාත් ම ඉඩ ඇත්තේ පහත පිළිතුරු අතුරින් කුමක් නිසා ද?

1. ඔවුන් ජීවත්වන පරිසරය අනුව
2. ඔවුන්ගේ භෝජන විලාසය අනුව
3. ඔවුන්ගේ සංචරන ක්‍රම අනුව
4. ඔවුන් විකා ගිලින භෝජන ක්‍රමය අනුව

04. පහත ගැලීම් සටහන්වලින් <u>වැරදි</u> ගැලීම් සටහන කුමක් ද?

1. ජලය $\xrightarrow[\text{ලබාදීම}]{\text{තාපය}}$ ජල වාෂ්ප
2. අයිස් $\xrightarrow[\text{ලබාදීම}]{\text{තාපය}}$ ජලය
3. ඝන ඉටි $\xrightarrow[\text{ඉවත් කිරීම}]{\text{තාපය}}$ ද්‍රව ඉටි
4. ද්‍රව ඉටි $\xrightarrow[\text{ඉවත් කිරීම}]{\text{තාපය}}$ ඝන ඉටි

05. චුම්බකයක් වටා යකඩ කුඩු යම් රටාවකට සකස් වී ඇති ආකාරය මෙම රූපයෙන් නිරීක්ෂණය කළ හැකි ය.



එහෙත් චුම්බකයට තරමක් ඈතින් වැටුනු යකඩ කුඩු අක්‍රමවත්ව විසිරී තිබෙනු දැකිය හැකි ය. මේ අනුව ආදර්ශනය කරනු ලබන්නේ චුම්බකයක ඇති කුමන ලක්ෂණයක් ද?

1. චුම්බක ක්ෂේත්‍රයයි.
2. චුම්බකය ප්‍රබලතාවයයි.
3. චුම්බකයක විකර්ෂණයයි.
4. චුම්බකයක ආකර්ෂණයයි.

06. අඟුරුවල පවතින භෞතික ගුණයක් වන්නේ මින් කුමක් ද?

1. දෘඩි බව
2. දිලිසීම
3. භංගුරතාව
4. ආඝාතවර්ධ්‍යතාව

07. ජෛව ස්කන්ධ ශක්ති ප්‍රභව පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1. සූර්යයා, මුහුදු රළ, භූ තාපය
2. න්‍යෂ්ටික ශක්තිය, ෆොසිල ඉන්ධන, ද්‍රව පෙට්‍රෝලියම් වායු
3. සුළඟ, ගලා යන ජලය, උදම් රළ
4. පිදුරු, ලී කුඩු, නරක් වූ ආහාර ද්‍රව්‍ය

08. A, B, C ද්‍රව්‍ය 3ක් පිළිබඳව සිසුන් දක් වූ අදහස් 3ක් පහත දැක්වේ.

A - බොර ජලය තුළින් බැලූ විට ජලය තුළ ඇති ජීවීන් පැහැදිලිව නොපෙනේ.


B - කාඩ්බෝඩ් තුළින් බැලූ විට අනෙක් පස ඇති ආලෝකය නොපෙනේ.

C - තුනී වීදුරුවක් සහිත චිමිනි ලාම්පුවක් දල් වූ විට ආලෝකය හොඳින් විහිදේ.

ඉහත ප්‍රකාශවලින් විස්තර කෙරෙන ද්‍රව්‍ය පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ කුමක් ද?

1. A - පාරභාසක ද්‍රව්‍ය B - පාරාන්ධ ද්‍රව්‍ය C - පාරදෘශ්‍ය ද්‍රව්‍ය
2. A - පාරභාසක ද්‍රව්‍ය B - පාරදෘශ්‍ය ද්‍රව්‍ය C - අදීප්ත ද්‍රව්‍ය
3. A - පාරදෘශ්‍ය ද්‍රව්‍ය B - අදීප්ත ද්‍රව්‍ය C - පාරදෘශ්‍ය ද්‍රව්‍ය
4. A - පාරාන්ධ ද්‍රව්‍ය B - පාරදෘශ්‍ය ද්‍රව්‍ය C - පාරභාසක ද්‍රව්‍ය

09.




A B C D

ඉහත රසායනික කෝෂ අතුරින් ද්විතික කෝෂ ලෙස සැළකිය හැකි කෝෂ පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

1. A හා B
2. C හා D
3. A හා D
4. B හා C

10.



ඉහත දක්වා ඇති ඉලෙක්ට්‍රොනික උපාංගය හා එහි කාර්යය නිවැරදිව දක්වා ඇති වරණය කුමක් ද?

1. ආලෝක විමෝචක ඩයෝඩය - ධාරාව ගලා යාම නිරීක්ෂණය කිරීමට
2. ඩයෝඩ - විදුලි ධාරාවක් එක් දිශාවකට පමණක් ගැලීමට සැලැස්වීමට
3. ප්‍රතිරෝධක - විදුලි ධාරාවක් පාලනය කිරීමට
4. ආලෝක සංවේදී ප්‍රතිරෝධක - පරිපථයට ආලෝකය වැටෙන විට ප්‍රතිරෝධය අඩුවීම


11. පහත උපකරණ අතුරින් ද්‍රව ප්‍රසාරණය උපයෝගී කරගෙන සාදා ඇති උපකරණය කුමක් ද?




1. ස්ටෙතස්කෝපය
2. එන්ඩොස්කෝපය
3. ද්‍රව පීඩන ජැක්කුව
4. රසදිය උෂ්ණත්වමානය

12. තාපය නිසා ඇති වන පාරිසරික බලපෑමකට අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

1. ඉඩෝර කාලවලදී වැව්, පොකුණුවල ජල මට්ටම පහළ බසී.
2. සමහර ප්‍රදේශවල ලැව්ගිනි හට ගෙන පහසුවෙන් පැතිරී යයි.
3. මුහුදු ජල මට්ටම ඉහළ යාම නිසා කුඩා දූපත් මුහුදු ජලයෙන් වැසී යයි.
4. ඉහළින් පිහිටි ප්‍රදේශයක ඇති ගල්, පස් පහළින් පිහිටි ප්‍රදේශ වෙත ලිස්සා යයි.


13. පහත දැක්වෙන පරිපථයේ A, B ස්ථානයට සවිකරන, ධාරාව අඩු කිරීම සඳහා යොදා ගනු ලබන උපාංගය දැක්වෙන සංකේතය කුමක් ද?





1. 
2. 
3. 
4. 

14. මෙම ආහාර ජාලයේ පිළිවෙළින් A හා B හිස්තැනට අදාළ සත්ත්වයා පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. අනිවාර්යයෙන්ම ශාක භක්ෂක වේ.
2. මාංශ භක්ෂක හා සර්ව භක්ෂක වේ.
3. ශාක භක්ෂක හා මාංශ භක්ෂක වේ.
4. සර්වභක්ෂක හා මාංශ භක්ෂක වේ.




15. 6 ශ්‍රේණියේ සිසුන් ජලය හා සම්බන්ධ ක්‍රියාකාරකමක් සඳහා ඉහත ඇටවුම සකස් කරන ලදී. එමඟින් ඔවුන් නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තු වනු ඇත්තේ කුමක් ද?




1. ජලය පවතින අවස්ථා හඳුනා ගැනීම.
2. වායුගෝලයේ ජල වාෂ්ප පවතී දැයි පරීක්ෂා කිරීම.
3. ජලය පවතින විවිධ ආකාර හඳුනා ගැනීම.
4. ජලයේ ලවණතාවය පරීක්ෂා කිරීම.

16.




ඉහත දක්වා ඇති ඇටවුමේ A, B, C හා D නලවලට මිලි ලීටර 500ක සමාන ජල පරිමා යොදා ඇත. ද්‍රව පදාර්ථවල පවතින කුමන ලක්ෂණයක් සොයා බැලීමට ඉහත ඇටවුම යොදා ගත හැකි ද?

1. ද්‍රව පදාර්ථවලට නිශ්චිත හැඩයක් නොමැති බව තහවුරු කර ගැනීමට
2. ද්‍රව පදාර්ථවලට නිශ්චිත පරිමාවක් ඇති බව තහවුරු කර ගැනීමට
3. ද්‍රව පදාර්ථවලට සුවිශේෂී වූ ගුණ ඇති බව තහවුරු කර ගැනීමට
4. ද්‍රව පදාර්ථ විවිධ හැඩ යටතේ විවිධ පරිමා ගන්නා බව තහවුරු කර ගැනීමට

17. පහත ප්‍රකාශ අතුරින් <u>අසත්‍ය</u> ප්‍රකාශය තෝරන්න.

1. ශබ්දය කන වෙත යොමු කිරීම සඳහා කන්පෙති උදව් වේ.
2. ශබ්දය නිපදවන්නේ යමක් කම්පනය වීමෙනි.
3. මිනිසා විසින් කෘතිමව ශබ්ද ඇති කිරීම නොකරයි.
4. කන් පෙතිවල හැඩය ශබ්ද ඇසීම සඳහා බලපායි.

- 18 හා 19 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ඉංග්‍රීසි අක්ෂරවලට යොදා ඇති දිස්ත්‍රික්ක සලකන්න.

A - කෑගල්ල B - රත්නපුර C - පුත්තලම D - නුවරඑළිය E - හම්බන්තොට

18. ශ්‍රී ලංකාවේ නාය යාම් වැඩිපුර ම වාර්තා වන දිස්ත්‍රික්ක මොනවා ද?

1. A, B හා C 2. B, C හා D 3. A, B හා D 4. B, D හා E

19. සුළං මගින් විදුලිය නිපදවීම සඳහා සුළං බලාගාර පිහිටා ඇති දිස්ත්‍රික්ක වන්නේ මොනවා ද?

1. A, C හා D 2. C, D හා E 3. A, B හා C 4. C, E හා A

20. පහත සඳහන් A, B හා C ක්‍රියාකාරකම් සලකන්න.

A - නගර සභාවෙන් කුණු, දිරාපත් වන ද්‍රව්‍ය හා දිරාපත් නොවන ද්‍රව්‍ය ලෙස වර්ග කර එකතු කිරීම.
B - සිසිල් බීම ඇසුරුම් කරන බෝතල් ඒ සඳහා යළි යළිත් යොදා ගැනීම
C - දිනපතා කෑම ඔතාගෙන යාමට පොලිතීන් කොළ වෙනුවට කෑම පෙට්ටියක් භාවිත කිරීම.


ඉහත ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ භාවිත කරන්නේ,


1. ඝන අපද්‍රව්‍ය කළමණාකරණය සඳහා ය. 2. භාවිතය අඩු කිරීම සඳහා ය.
3. නැවත භාවිතය වැඩි කිරීම සඳහා ය. 4. නගර අලංකරණය සඳහා ය.

(ලකුණු 20 X 2 = 40)

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (A) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සකස් කළ කොළඹ නගරයේ එක් එක් මාසයේ සාමාන්‍ය වර්ෂාපතනය හා උෂ්ණත්වය දැක්වෙන ප්‍රස්තාර දෙකක් පහත දැක්වේ.




8531

ඉහත ප්‍රස්තාර අධ්‍යයනය කර පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


(i) කොළඹ නගරයට වැඩිම වර්ෂාපතනයක් ලැබෙන්නේ කුමන මාසයේ ද? (ලකුණු 1)


(ii) කොළඹ නගරයේ වැඩිම සාමාන්‍ය උෂ්ණත්වය කුමක් ද? (ලකුණු 1)


(iii) ප්‍රස්තාර දෙකට අනුව ජූලි හා අගෝස්තු මාසවල වර්ෂාපතනය හා උෂ්ණත්වය අතර ඔබ දකින සම්බන්ධතාවය කුමක් ද? (ලකුණු 2)

(iv) වර්ෂාවේ ප්‍රමාණය මැන ගැනීම සඳහා කාලගුණ මධ්‍යස්ථානවල භාවිත කරන උපකරණය කුමක් ද? (ලකුණු 1)

(v)


A


B


C

ඉහත A, B, C රූප හඳුනාගෙන එම උපකරණවල නම් ලියන්න. (ලකුණු 3)

(vi) සුළඟේ වේගය මැනීම සඳහා භාවිතා කරන උපකරණය අනිලමානයයි. එය වට දහයක් කැරකැවීමට මිනිත්තු දෙකක් ගත වූයේ නම් සුළඟේ වේගය කුමක් ද? (ලකුණු 2)

(B) එක් එක් ප්‍රකාශයට අදාළ නිවැරදි වචනය තෝරන්න.

(i) ස්කන්ධයක් ඇති අවකාශයේ ඉඩක් ගන්නා ද්‍රව්‍ය ...................... (ප්‍රභව, පදාර්ථ, ශක්ති) ලෙස හැඳින්වේ.

(ii) කම්බි සෑදීමට සුදුසු ද්‍රව්‍යයකි. ...................... (රබර්, ඇලුමිනියම්, දියමන්ති)


(iii) පෘථිවි පෘෂ්ඨයෙන් 70% ට වඩා ජලයෙන් වැසී ඇත. නමුත් ඉන් පරිභෝජනයට ගත හැක්කේ ...................... වැනි සුළු ප්‍රමාණයකි. (1%, 0.01%, 0.1%)

(iv) රිද්මයානුකූල නොවන ...................... ශබ්ද ඝෝෂා ලෙස හැඳිවේ. (විධිමත්, අවිධිමත්, මිහිරි)

(v) චුම්බකයක ආකර්ශනය වැඩියෙන් ම ඇත්තේ ...................... වලය. (උත්තර ධ්‍රැව, දක්ෂිණ ධ්‍රැව, ධ්‍රැව)

(vi) කාර්යක්ෂම විදුලි බුබුළු වන ...................... හා ...................... භාවිත කිරීමෙන් විදුලිය වැය වීම අඩු කර ගත හැකි ය. (LED හා LCD, LED හා CFL, LDR හා LED) (ලකුණු 6)

(02) (A) රූපයේ දක්වා ඇති A සහ B වීදුරු දෙක එකිනෙකට ගැළවිය නොහැකි සේ තදින් සවි වී ඇත. ඒවා වෙන් කර ගැනීම පිණිස පහත ඇටවුම භාවිත කරන ලදී.





(i) වීදුරු දෙක වෙන් කර ගැනීම සඳහා A වීදුරුව තුළට සිසිල් ජලය දමන්නේ ඇයි? (ලකුණු 1)

(ii) B වීදුරුව උණු ජලයේ ස්පර්ශ වීමට තැබීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද? (ලකුණු 1)

(iii) ඉහත සිසිල් ජලය සහිත A වීදුරුවට උණු ජලය ද, උණු ජලය භාජනය වෙනුවට සිසිල් ජලය භාජනයක් භාවිතා කිරීමෙන් වීදුරු දෙක එකිනෙකින් වෙන් කර ගත හැකි ද? නොහැකි ද? (ලකුණු 1)

(B)




(i) මෙම ඇටවුමෙන් ඔබට නිරීක්ෂණය කළ හැක්කේ කුමක් ද? (ලකුණු 1)

(ii) ස්වාභාවික ආලෝක ප්‍රභව දෙකක් ලියන්න. (ලකුණු 1)

(iii) සන්නිවේදන කටයුතුවලදී ආලෝකය ප්‍රයෝජනයට ගන්නේ කෙසේ ද? (ලකුණු 1)

(iv) ආලෝකය සංඥාවක් ලෙස භාවිත කරන අවස්ථාවකට උදාහරණයක් ලියන්න. (ලකුණු 1)

(C)

(i) ශබ්දය හා සංවේදී වන මිනිස් සිරුරේ ඉන්ද්‍රිය කුමක් ද? (ලකුණු 1)

(ii) පහත උපකරණවල ශබ්දය නිපදවන ක්‍රමය ලියන්න.

(a) සිතාරය (b) සර්පිනාව (c) ගැටබෙරය (d) බටනලාව (ලකුණු 2)

(iii) කන් ආරක්ෂක පැළඳුමක් භාවිත කිරීමෙන් ලැබෙන එක් ප්‍රයෝජනයක් ලියන්න. (ලකුණු 1)


(03) (A) හැඩය අනුව චුම්බක විවිධ වේ.



A B C

(i) ඉහත දක්වා ඇති විවිධ චුම්බක වර්ග හඳුනාගෙන නම් ලියන්න. (ලකුණු 1 1/2)

(ii) ආවරණය කළ දණ්ඩ චුම්බකයක්, තවත් දණ්ඩ චුම්බකයක් අසලට ගෙන ආ විට ආකර්ශනය විය.




ආකර්ශණය වීම

(a) A ධ්‍රැවයේ නම කුමක් ද? (ලකුණු 1)

(b) N අසලට B ලං කළ විට ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 1)


(iii) ඉහත ඔබට සපයා ඇති දණ්ඩ චුම්බක දෙක අතුරින් වැඩි චුම්බක බලයක් ඇති චුම්බකය තෝරා ගන්නේ කෙසේ ද? ඔබට මේ සඳහා අල්පෙනෙති කිහිපයක් සපයා ඇත. (ලකුණු 1)

(iv) නිවසේ දී චුම්බක භාවිත කර ඇති අවස්ථාවකට උදාහරණයක් දෙන්න. (ලකුණු 1)

(B) ජලය පවතින එක් ආකාරයක් වර්ෂණය ලෙස හඳුන්වයි.

(i) ජලය පවතින අනිත් ආකාර දෙක මොනවා ද? (ලකුණු 2)

(ii)



A 61g B 60g C 60.5g


ජලයේ ලවණතාවය පරීක්ෂා කිරීම සඳහා යොදා ගන්නා ලද සමාන ජල පරිමාවල ස්කන්ධය දක්වා ඇත.

(a) සමාන පරිමාවක ස්කන්ධය සැලකූ විට A, B, C බීකර තුනෙන් ලවණතාවය ආරෝහණ පිළිවෙළට සකසන්න. (ලකුණු 1)

(b) ඉහත ඔබේ නිගමනය පදනම් කරගෙන A, B, C මිරිදිය, කරදිය හා කිවුල් දිය ලෙස වෙන් කරන්න. (ලකුණු 1 1/2)

(c) කරදියෙහි බහුලව අඩංගු වන ලවණ වර්ගය කුමක් ද? (ලකුණු 1)

(04) (A) (i) පහත දක්වා ඇති විද්‍යුත් පරිපථය සම්මත සංකේත යොදා ගනිමින් ඇඳ දක්වන්න.



(ලකුණු 2)

(ii) LED යක් සාමාන්‍ය බල්බයකින් වෙනස් වන එක් කරුණක් ලියන්න. (ලකුණු 1)

(B) පහත දැක්වෙන ප්‍රකාශ හරි නම් '✓' ලකුණ ද වැරදි නම් 'X' වැරදි ලකුණ ද ඉදිරියෙන් යොදන්න.

(a) පරිපථය තුළින් ගලන ධාරාව වෙනස් කර ගැනීමට ධාරා නියාමකය භාවිත කරයි. ( )

(b) LDR මතට ආලෝකය වැටෙන විට ප්‍රතිරෝධය වැඩි වේ. ( )

(c) වියළි කෝෂය ද්විතියික කෝෂයකි. ( )

(d) විදුලි උත්පාදනය සඳහා මුහුදු රළ, න්‍යෂ්ටික ද්‍රව්‍ය භාවිත කළ හැකි ය. ( )

(ලකුණු 4)

(C) සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.


(i) සතුන්ගේ දැකිය හැකි නමුත් බොහෝ ශාකවල දැකිය නොහැකි ලක්ෂණයක් වන්නේ ....................

(ii) විද්‍යාගාරයේ දී කාබන්ඩයොක්සයිඩ් වායුව හඳුනා ගැනීමට භාවිත කළ හැකි ද්‍රව්‍යයක් වන්නේ ............................

(iii) ශාක හා සතුන් වර්ග කිරීම සඳහා ............................ ක්‍රමය යොදා ගත හැකි ය.

(iv) ගසක වෙසෙන පක්ෂීන් නිරීක්ෂණයට වඩාත් සුදුසු උපකරණය වන්නේ ............................ වේ. (ලකුණු 4)

(05) (A) 6 ශ්‍රේණියේ සිසුන් තම පන්තිය අලංකරණය සඳහා මාළු ටැංකියක් යොදා ගත්තේ ය. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) ඉහත පරිසරයේ දැකිය හැකි අජීවී ද්‍රව්‍යයක් නම් කරන්න. (ලකුණු 1)

(ii) මෙම ටැංකියේ සිටින මාළුවෙකු නොවන වෙනත් සත්ත්වයෙකු සඳහන් කරන්න. (ලකුණු 1)

(iii) ටැංකිය හොඳින් වසා ඇති හෙයින් මතුපිට ජල පෘෂ්ඨයේ මාළුන් වැඩි දෙනෙකු සිටින බව එක් සිසුවෙක් නිරීක්ෂණය කළේ ය. මතුපිට ජල පෘෂ්ඨයේ වැඩි මාළු සංඛ්‍යාවක් නිරීක්ෂණය කිරීමට හැකි වන්නේ ඇයි? (ලකුණු 1)

(B) (i) ජලයේ දිය වී ඇති ඔක්සිජන් වායුව භාවිත කර මත්ස්‍යයින් සිදු කරන ජීව ක්‍රියාව කුමක් ද? (ලකුණු 1)

(ii) මාළු ටැංකියේ යොදා ඇති ශාක කොළ පැහැති ජලජ ශාක වේ. මෙම ශාක මගින් දිවා කාලයේ දී සිදු වන ජීව ක්‍රියාවලිය කුමක් ද? (ලකුණු 1)

(iii) ඉහත ජීව ක්‍රියාවලිය සඳහා ජලජ ශාක ලබා ගන්නා වායුව කුමක් ද? (ලකුණු 1)

(iv) ටැංකියේ පතුලට කුඩා ගල් කැබලි ස්ථරයක් අතුරා ඇත. එම ස්ථරය ජලයේ පවිත්‍රතාවය රඳවා ගැනීමට වැදගත් වන්නේ කෙසේ ද? (ලකුණු 1)

(v) (a) මෙහි දක්වෙන මාළුන්ගේ සංචරණ ක්‍රමය කුමක් ද? (ලකුණු 1/2)

(b) එම සංචරන ක්‍රමය සඳහා ඔවුන්ගේ දේහය සතු ලක්ෂණයක් ලියන්න. (ලකුණු 1/2)


(C) විවිධ භාවිත සඳහා ඝන පදාර්ථ යොදා ගන්නා අවස්ථා කිහිපයක් පහත දක්වා ඇත. එම ද්‍රව්‍ය භාවිත කර ඇත්තේ කවර භෞතික ගුණය නිසා දැයි දක්වන්න.

(i) ගොඩනැඟිලිවල ජනෙල් සඳහා ඇලුමිනියම් භාවිතා කරයි. (ලකුණු 1)

(ii) කැරම් ලෑල්ලක පුයර අතුරයි. (ලකුණු 1)

(iii) උදළු තලය සෑදීම සඳහා වානේ භාවිත කරයි. (ලකුණු 1)

(06) (A) තණකොළ වැවුනු ප්‍රදේශයක සතුන් අතර දැකිය හැකි ආහාර සම්බන්ධතා නිරූපනය කරන සටහනක් පහත දක්වේ.




(i) මෙහි දක්වෙන පුරුක් 3ක් සහිත ආහාර දාමයක් ලියන්න. (ලකුණු 1)

(ii) (a) ඉහත සටහන හැඳින්වීමට යොදන නම කුමක් ද? (ලකුණු 1)

(b) එය ආහාර දාමයකින් වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 1)

(iii) ඉහත සටහනේ ඇති ශාක භක්ෂකයෙක් හා මාංශ භක්ෂකයකු නම් කරන්න. (ලකුණු 2)

(iv) ශාක ස්වයංපෝෂීන් ලෙස හඳුන්වන්නේ ඇයි? (ලකුණු 1)

(B) (i) විදුලිය සංරක්ෂණය කර ගැනීමට ඔබ පහත අවස්ථාවලදී අනුගමනය කරන ක්‍රියාමාර්ගයක් ලියන්න.

(a) පරිගණක භාවිතයේ දී

(b) නිවස තුළ ශීතකරණ භාවිතයේ දී


(c) විදුලි ස්ත්‍රික්කය භාවිතයෙන් රෙදි මැදීමේ දී (ලකුණු 3)

(ii) පහත සඳහන් අවස්ථාවල විදුලි අනතුරු වළක්වා ගැනීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ගයක් ලියන්න.

(a) නිවසේ විදුලි පරිපථ නඩත්තු කටයුත්තක දී

(b) ඇන්ටෙනා සවි කිරීමේ දී (ලකුණු 2)

(07) (A) අවස්ථා විපර්යාසය නිරීක්ෂණය සඳහා සිදු කළ ක්‍රියාකාරකමට අදාළ රූප සටහනක් පහත දැක්වේ.




(i) P ලෙස දක්වා ඇත්තේ ඉටිවල කුමන අවස්ථාව ද? (ලකුණු 1)

(ii) X ස්ථානයට දල් වූ ගිනි කූරක් ඇල්ලූ විට ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 1)


(iii) නිවසේ දී ඝන, ද්‍රව, වායු අවස්ථා තුනම ලබා ගත හැකි ද්‍රව්‍ය දෙකක් ලියන්න. (ලකුණු 2)

(iv) කම්මලක ආයුධ තැනීමේ දී යකඩ තදින් රත් කරන විට ලැබෙන අවසන් වර්ණය කුමක් ද? (ලකුණු 1)

(v) ෆොසිල ඉන්ධන වෙනුවට භාවිතා කළ හැකි විකල්ප ශක්ති ප්‍රභවයක් නම් කරන්න. (ලකුණු 1)

(vi) පෘථිවියේ උෂ්ණත්වය ඉහළ යෑමට බලපාන මිනිස් ක්‍රියාකාරකමක් ලියන්න. (ලකුණු 1)

(B) කම්බි දඟරයකින් විදුලිය නිපදවීම සඳහා සිසුන් කණ්ඩායමක් කර වූ ක්‍රියාකාරකමක රූප සටහනක් පහත දැක්වේ.




(i) P උපකරණය නම් කරන්න. (ලකුණු 1)

(ii) ඉහත චුම්බකය කම්බි දඟරය තුළ ඉදිරියට හා පසුපසට චලනය කරන විට දක්නට ලැබෙන නිරීක්ෂණය කුමක් ද? (ලකුණු 1)

(iii) ඉහත ආකාරයේ විදුලිය නිපදවන ඇටවුමක් භාවිතා වන අවස්ථාවක් දක්වන්න. (ලකුණු 1)

(iv) විදුලි බලාගාරවලදී ෆොසිල ඉන්ධන දහනය කර තාපය නිපදවයි. එම තාපය ටර්බයින කැරකැවීම සඳහා යොදා ගන්නේ කෙසේ ද? (ලකුණු 1)

For more past papers and exam resources,visit www.pastpaperszone.lk